**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2016**

**-----------------------------------------------------------**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 38 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 නොවැම්බර් 22 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) "නවබිම ගබඩා පරිශ්‍රයේ" (Yard) ගබඩා කොට තිබූ කිලෝ ග්‍රෑම් 1,500 ක් වූ අබලි තොග වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සෙමෙන් චලනය වන හා යල් පැනගිය තොග වෙනුවෙන් වූ රු.3,048,557 ක වෙන්කිරීම 2013 වර්ෂයේ සිට කිසිදු සමාලෝචනයකින් තොරව ඉදිරියට ගෙන එමින් තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11**

ඉදිකිරීම් ව්‍යාපෘති පහකට අත්තිකාරම් වශයෙන් ලබාදුන් රු 15,617,194 ක් වූ මුළු මුදලම කෙරීගෙනයන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**

2016 වර්ෂයේදී ලද රු 45,000,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් පුනරාවර්තන ස්වරූපයේ වියදම් රු 2,486,663 ක් පමණක් ආදායම් ලෙස ගිණුම් ගත කල යුතු අතරම රු 37,635,995 ක් වූ ප්‍රාග්ධන වියදම් සඳහා ක්‍රමක්ෂය ගැලපීම් සිදුකල යුතු වුවත් රු 40,122,660 ක් මුළු ප්‍රාග්ධන වියදම ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ වල සිට පැවත එන රු 277,910,082 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයෙන් උත්පාදනය වූ වත්කම්වල වාර්ෂික ක්ෂය පදනම් කරගෙන ක්‍රමක්ෂය ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීමේදී එය මූල්‍ය තත්ත්වය විනිවිදව හා සාධාරණව නිරූපනය කිරීමට ඉවහල්වන්නක් විය යුතුයි. එසේ වුවද, ණයගැතියන් සඳහා අඩමාන ණය වෙන්කිරීමේදී ණයගැතියන්ගෙන් වර්ෂ 05 ට අඩු ණයගැතියන් සඳහා සෑම වර්ෂයකම සියයට 10 ක වෙන්කිරීමක් හා

වර්ෂ 05 ට වැඩි ණයගැතියන් සඳහා සියයට 100 ක වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ හේතුවෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේදී රු. 3,573,133 ක අමතර අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට ප්‍රදාන ලෙස ලැබුණු වටිනාකම සඳහන් නොවූ තොග අයිතමයන් වල වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් 07 ක් රු.67,437,864 ක් වූ ප්‍රත්‍යාගණිත අගයට ගිණුම් ගතකර තිබියදී වාර්ෂික ක්ෂය, පිරිවැය මත ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.1,333,284 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල හා මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලබන එකතුව අක්කර 37 ක් පමණ වූ මුළු ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබූ අතර එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීම ද සිදුකර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ රු.2,032,627 ක අයහාර වියදම් එම වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැරීම වෙනුවට වෙනත් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත කරුවන්ගෙන් අයවිය යුතු මුළු හිඟ ශේෂ කාර්මික ජනපද අංශයේ වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී රු.16,268,718 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් ලෙජර් ගිණුම්වල ශේෂයන් පිළිවෙලින් රු. 676,552,750 ක් හා රු.141,320,244 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂ පිළිවෙලින් රු. 767,367,687 ක් හා රු. 50,156,899 ක් වීමෙන් පිළිවෙලින් රු. 90,814,937 ක හා රු. 91,163,345 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 හා 2015 වර්ෂවලදී වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු මණ්ඩලයේ සේවයේ නියුතු දේපළ තක්සේරු කිරීම සම්බන්ධයෙන් වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරියෙකු විසින් සිදු කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් උපලේඛනය හා එක් එක් වත්කමේ ප්‍රත්‍යාගණන තක්සේරු වටිනාකම පිළිබඳ තොරතුරු 2017 ඔක්තෝබර් 30 දින වන තෙක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 05 ඉක්මවූ විවිධ ණයහිමි ශේෂයේ ඇතුළත් රු.3,072,949 ක ශේෂය පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂවල එකතුව රු. 66,517,993 ක් වූ අතර, ඉන් වර්ෂ 05 ක් ඉක්ම වූ රු.39,436,868 ක ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම වර්ෂ 05 ඉක්ම වූ ණයහිමි ශේෂය රු. 28,955,811 ක් වූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට අය නොවී පවතින සේවක ණය ශේෂය රු.743,533 ක් විය.

(ඇ) කලින් ගෙවීම් හා සේවකයන්ට දුන් අත්තිකාරම් රු.14,457,340 ක ශේෂයෙන් රු. 8,022,004 ක ශේෂය 2014 වර්ෂයේ සිට වෙන්කිරීමක් ලෙස අඩුකර දක්වා තිබුණි.

(ඈ) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අබලි යකඩ මිලදී ගැනීමේදී සැපයුම්කරුවන්ට ගෙවන ලද රු. 4,317,934 ක අත්තිකාරම් මුදල් 2017 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඉ) කාර්මික ජනපද 12 ක කර්මාන්ත ස්ථාපිත කර ඇති කර්මාන්තකරුවන් 228 දෙනෙකුගෙන් බදුකුලී වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.16,058,303 ක් අයවිය යුතුව පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) | මුදල් රෙගුලාසි 571(2) | වසර 02 ඉක්ම වූ රු. 2,767,275 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 757 | 2016 වර්ෂයට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව අනාවරණය වූ රු.395,754 ක අතිරික්තතා හා රු.332,028 ක ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 770 | 2015 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී පාවිච්චියට ගත නොහැකි ලෙස නම් කල භාණ්ඩ අයිතම 38ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.30,029,583 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,259,111 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.57,288,694 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු.10,750,000 කින් හා විකුණුම් හා සේවා ආදායම රු.44,720,265 කින් පහළ යාම හා පරිපාලන වියදම් රු.29,945,023 කින් ඉහළ යාම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.84,728,727 ක් වූ ඌනතාවය 2014 වර්ෂයේදී අතිරික්තයක් බවට පත්වී 2015 වර්ෂයේදී රු.27,259,111 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එය රු.30,029,583 ක ඌනතාවයක් දක්වා පිරිහී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමෙන් පසුව 2013 වර්ෂයේ දී රු.68,532,050 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු. 142,949,647ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාපනය කරන ලද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අරමුණ කර්මාන්තකරුවන් දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම, හා සංවර්ධනය කිරීම වන අතර, කාර්මික ජනපද 19 ක් , දිස්ත්‍රික් කාර්යාල 25 ක්ද, ඇතුළත්ව ඉංජිනේරු තාක්ෂණික සේවා, අලෙවි, රබර් සංවර්ධන සහ සම්භාණ්ඩ සංවර්ධන යනාදී අංශයන්ගෙන් මණ්ඩලය සමන්විත වේ. මණ්ඩලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) අලෙවි අංශය

---------------

අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය, උප කොන්ත්‍රාත් ලබාගැනීම, ප්‍රදර්ශන සංවිධානය කිරීම, ලක්කම් හා ලක් නිපැයුම් මධ්‍යස්ථානවල අලෙවි පහසුකම් සැපයීම, ව්‍යවසායකයින් සඳහා වාණිජ හා තාක්ෂණික වැඩසටහන් පැවැත්වීම යනාදිය අලෙවි අංශයේ කාර්යයන් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අබලි ද්‍රව්‍ය විකුණුම් ආදායම අලෙවි අංශයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වුවද 2015 වර්ෂයේ රු. 103,970,263ක් ව පැවැති එම ආදායම 2016 වර්ෂයේදී රු.43,044,099 ක් ලෙස රු.60,926,164 කින් හෙවත් සියයට 59 කින් අඩුවී තිබුණි.

(ii) ලක් නිපැයුම් අලෙවි මධ්‍යස්ථානයේ අභිවෘද්ධිය සඳහා කිසිඳු වැඩ පිළිවෙලක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන් ලක් නිපැයුම් මධ්‍යස්ථානයෙන් 2016 වර්ෂය සඳහා ලද කොමිස් ආදායම රු.1,206 ක් පමණක් වූ අතර, ලක් නිපැයුම් අලෙවි සැල 2017 අප්‍රේල් මාසයේ සිට වසා දමා තිබුණි.

**(ආ) ප්‍රාදේශීය සංවර්ධන අංශය**

---

මෙම අංශය මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා කර්මාන්ත ශක්තිමත් කිරීම, ප්‍රවර්ධනය හා නගා සිටුවීම හා ගෝලීය වෙළඳපොළ කරා යොමු කිරීම අරමුණු කර ගෙන ක්‍රියාකාරකම් 47ක් සැලැසුම් කර තිබුණි. ඉන් ක්‍රියාකාරකම් 6 ක කිසිදු ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණ අතර තවත් ක්‍රියාකාරකම් 25 ක ප්‍රගතිය සියයට 2 සිට සියයට 25 ක් දක්වා අඩු පරාසයක පැවතුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යවසායකයින් සඳහා බෙදා දීමේ අරමුණින් 2007 හා 2008 වර්ෂවලදී මිලදී ගත් වටිනාකම රු. 7,417,960 ක් වූ තොගයක් හා සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.774,416 ක තොගයක් විගණිත දිනය වූ 2017 දෙසැම්බර් 04 වන දින වනවිටද බෙදා දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්මික ජනපද

---

(i) 1996 වර්ෂයේ හා 2000 වර්ෂයේ සිට ජනපද 05 ක අනවසර පදිංචිකරුවන් සිටීම හේතුවෙන් ඉඩම් කට්ටි 59 ක් කර්මාන්ත ගැන්වීමට කටයුතු කර නොතිබුණ අතර, ජනපද 07 කට අදාලව බිම් කොටස් 71 ක් සංවර්ධනය කර කර්මාන්තකරුවන්ට ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ii) බද්දේගම කාර්මික ජනපදය පිහිටුවා ඇති ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක් වන අතර එය පවරා ගැනීම සඳහා 2007 වර්ෂයේදී රු. 500,000 ක අත්තිකාරමක් හා පිඹුරුපත් සැකසීම හා මැනුම් කටයුතු සඳහා රු.15,576 ක් ද 2007 ඔක්තෝබර් 05 දින ගෙවා තිබුණද එම ඉඩම මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. එමෙන්ම පවරා නොගත් අක්කර 1 රූඩ් 2 පර්චස් 0.5 ක්වූ බද්දේගම හා අක්කර 10 පර්චස් 29.2 ක්වූ බෙලිඅත්ත කාර්මික ජනපද අදාළ අරමුණ සඳහා යොදා නොගැනීම හේතුවෙන් වර්තමානය වන විට එම ඉඩම් ජනාවාස බවට පත්වී තිබුණි.

(iii) මණ්ඩලයට අයත් ගාල්ල කරන්දෙණිය කාර්මික ජනපදයේ අක්කර 2 යි රූඩ් 1 යි පර්චස්.11.6 ක් වූ ඉඩමේ කර්මාන්තකරුවන් විසින් කර්මාන්ත පවත්වා ගෙනයාම නවත්වා පදිංචිය සඳහා යොදාගෙන තිබුණි. එම ඉඩම් නිසි අධිකාරී බලයකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2017 අගෝස්තු 29 දින කරන්දෙණිය ප්‍රාදේශිය ලේකම් වෙත පවරා දීමට කටයුතු කර තිබුණි.

**4.3 අරමුදල් උපයෝජනය**

---

පානළුව කාර්මික ජනපදයට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2016 සැප්තැම්බර් මාසයේදී අමාත්‍යාංශයෙන් ලැබුණු රු. මිලියන 25 ක මුදල 2017 සැප්තැම්බර් වන තෙක් අදාළ කාර්යයට යොදා නොගෙන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

**4.4 හඳුනාගත් පාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී සේවක පාරිශ්‍රමිකය තුල ඇතුලත් ජීවන වියදම් දීමනාව සැලකිල්ලට ගෙන නොතිබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදයට අදාලව අධිභාර ලෙස රු.6,469,791 ක් සමාලෝචිත වර්ෂය තුලදී මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(ආ) වාර්ෂික වාහන බලපත්‍ර ගාස්තු, පාරිතෝෂික මුදල් හා වරිපනම් ගෙවීම් නියමිත දිනට සිදු නොකිරීම හේතුවෙන් අධිභාර ලෙස රු. 43,257 ක් ගෙවා තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය වත්කම්**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් මහියංගන මියුනුගම පිහිටි ගොඩනැගිල්ල කිසිදු කටයුත්තක් සඳහා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පවතින අතර මෙහි ආරක්ෂක සේවාව ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.714,248 ක් වැයකර තිබුණි.

(ආ) සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය අමාත්‍යාංශය යටතේ වන නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ඉදිකරන ලද නාගහමඩ නීලවබැද්ද ගොඩනැගිල්ලෙහි පළතුරු ආශ්‍රිත නිෂ්පාදනයන් කිරීමට අවශ්‍ය යන්ත්‍ර උපකරණ මණ්ඩලයෙන් රු.1,283,500 ක් වැයකර මිලදීගෙන 2012 මාර්තු 06 දින ජනතා අයිතියට පත්කර තිබුණද, එදින සිට වාර්තාවේ සඳහන් දිනය දක්වාම එම උපකරණ කිසිදු ඵලදායී කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**4.6 ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

---------------------------

වටිනාකම රු.9,318,026 ක් වූ රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය මිළදී ගැනීමට පළමු ලංසු කැඳවීමේදී ඉදිරිපත් වූ මිල ගණන් ඉහළ අගයක් වීම හේතුවෙන් අවලංගු කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 හා 7.8.4 මාර්ගෝපදේශ අනුව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් නොකිරීම විශාල බැහැර වීමක් ලෙස සැලකිය යුතු වුවද, දෙවන වර ලංසු කැඳවීමේදී ලංසු සුරක්ෂණය වෙනුවෙන් මණ්ඩලය නමට ලියන ලද රු. 182,520 ක චෙක්පතක ඡායා පිටපතක් ඉදිරිපත් කළ සැපයුම්කරු සාර්ථක ලංසුකරු ලෙස පිළිගෙන කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 725 න් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 232 ක් වූ අතර එයින් තනතුරු 106 ක් විධායක තනතුරු වන අතර තනතුරු 126 ක් විධායක නොවන තනතුරු විය.

(ආ) බඳවා ගැනීම් පරිපාටියට පටහැනිව 2015 දෙසැම්බර් 01 දින සිට ව්‍යාපාර ප්‍රවර්ධනයට නිලධාරීන් අටදෙනෙකු හා කළමනාකරණ සහකාර නිලධාරීන් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන තිබුණි. ඔවුන්ගේ කොන්ත්‍රාත් කාලය අදාල ගිවිසුම අනුව 2016 මැයි 31 දිනෙන් අවසන් වී තිබුණද සේවය අවසන් කිරීමකින් තොරව නැවත දැනුම් දෙන තුරු සේවා කාලය දීර්ඝ කර තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සම්බන්ධීකාරක තනතුරක් සඳහා 2016 ජනවාරි 20 දින සිට නිළධාරියකු බඳවා ගෙන මාසිකව ඉන්ධන දීමනා, රියදුරු වැටුප්, දුරකථන දීමනා ඇතුළුව රු.83,069 ක් සහ උපදේශකවරුන් තිදෙනෙකු බඳවා ගෙන මාසිකව රු. 168,800 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ඇ) අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සඳහා නිලධාරීන් පත් නොකිරීම හේතුවෙන් නිලධාරීන් 13 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත පත්කර වැඩ බැලීමේ වැටුප් වශයෙන් 2016 වර්ෂයේදී රු.830,546 ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන්ගේ වැඩබැලීමේ කාල සීමාව වසර 02 සිට වසර 10 ක් දක්වා කාල පරාසයක විහිදී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 සැප්තැම්බර් 25 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරය මඟින් ලබාදෙන ප්‍රතිපාදන සඳහා පමණක් සමාලෝචිත වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද මණ්ඩලයේ ආදායම් වලින් කරනු ලබන ප්‍රසම්පාදනයන් එම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 සහ 5.2.4 වගන්ති ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

### 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2013 , 2014 හා 2015 වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | (i) | බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දිගුකාලීන ප්‍රමාදයන් පැවතීම. |
| | | (ii) | විවිධ අංශවල මූල්‍ය ගනුදෙනු වලට අදාල ලියකියවිලි ගිණුම් අංශය වෙත කාර්යක්ෂමව රැස් නොකිරීම. |
| | | (iii) | අත්තිකාරම් ලබා දීමේදී කාර්යයන් සඳහා අවශ්‍ය මුදලට වඩා වැඩිපුර අත්තිකාරම් නිකුත් කිරීම. |
| | | (iv) | සරප් අංශයේ මුදල් භාරගැනීම කාර්යාල වේලාවෙන් පසුව සිදුකිරීම හා සේප්පුවේ තැන්පත් කිරීම නියමිත පරිදි සිදු නොකිරීම. |
| (ආ) | ඉඩම් බදුදීම | | කාර්මික ජනපද 09 කට අදාලව ගොඩනැගිලි 31 ක් හා ඉඩම් කැබලි 57ක් සඳහා නීත්‍යානුකූල බදු ගිවිසුම් අත්සන් කර නොතිබීම. |
| (ඇ) | තොග පාලනය | (i) | ශේෂයක් නොමැති තොග අයිතමයන් සඳහා තොග ලේඛන නඩත්තු කිරීම. |
| | | (ii) | හානි වූ තොග ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | ඇතැම් තොග අයිතම සම්බන්ධයෙන් ලෙජර් කාඩ් හා බින් කාඩ්පත් ශේෂ අතර අසමානතාවයන් පැවතීම. |

.